# චෝල පාලන සමයේ ඉදිකරන ලද හින්දු දේවාල

**හැඳින්වීම**

මෙම ලිපියෙන් විමසා බැලෙන්නේ දකුණු ඉන්දියාවේ චෝළ පාලන සමය (මධ්‍ය 9 සියවස සිට 13 සියවස) තුළ ඉදිකරන ලද හින්දු දේවාලය පිළිබඳව ය. ඉන්දියන් සාගරයේ මුහුදු වෙළදාම අත්පත් කර ගැනීමේ නොනිත් ආශාවෙන් කටයුතු මෙහෙයවූ චෝල පාලකයන් ඉතා විශාල ගණනක් වූ හින්දු දේවාල දකුණු ඉන්දියාවේ ද, ශ්‍රී ලංකාවේ කිහිපයක් ද චීනයේ එක් දේවාලයක් ද වශයෙන් ඉදි කර ඇත. එකම කාල පරාසයක දී රටවල් තුනක ඉදිවූ හින්දු දේවාල කලාත්මක අතින් එකිනෙකට බොහෝ සමාන කම් සහිතව ගොඩනගා ඇත. අධ්‍යයන ප්‍රදේශය ඉතාම පුළුල් වන හෙයින් ශ්‍රී ලංකාවේ හා දකුණු ඉන්දියාවේ තෝරාගත් හින්දු දේවාල කිහිපයක් ද මෙහි දී ඉදිරිපත් කර ඇත.

**සාකච්ඡාව**

දකුණු ඉන්දියාව තුළ බලය ස්ථාවර කරගත් චෝලයන් ඉන්දියන් සාගරයත් ඉන් තව බොහෝ දුර යමින් පැසිපික් සාගරයත් සෘජු හා වක්‍ර අයුරින් අවනත කරගන්නට උත්සාහ කරනු දැකිය හැකි ය. අනුරාධපුර රාජධානිය කර ගෙන සිටි V මහින්ද (ක්‍රි.ව.1001-1017) රජතුමා බලයෙන් පහ කර චෝළ පාලන බලය මෙරට ස්ථාපිත කරන අතර එය ක්‍රි.ව. 1070 දී පළමු වන විජයබාහු (ක්‍රි.ව. 1056-1111) රජතුමා විසින් පරාජයට පත් කරන තෙක් ම පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී. මෙම පාලන කාල සීමාව තුළ චෝළ රජවරු පස් දෙනෙක් විශේෂ කොට හැඳින්විය හැකි ය. එනම් රාජේන්ද්‍ර චෝල (ක්‍රි.ව.1017 - 1044), රාජාධිරාජ චෝළ (ක්‍රි.ව.1044-1054), II රාජේන්ද්‍ර චෝළ (ක්‍රි.ව.1051-1063), වීර රාජේන්ද්‍ර චෝළ (ක්‍රි.ව.1063-1067) හා ප්‍රතිරාජේන්ද්‍ර චෝළ (ක්‍රි.ව.1067-1070) වේ. ඉහත පාලකයන්ගේ කාල වකවානුවේ ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශය තුළ චෝළ පාලනය ඉතා ශක්තිමත් ලෙසට ස්ථාවර විය. එහි බලපෑම පොළොන්නරු රාජධානිය තුළ තවමත් දෘශ්‍යමාන වේ. ශිව, විෂ්ණු හා ගණේෂ යන දෙවිවරුන් මුල්කොටගෙන හින්දු දේවාල ගණනාවක්ම පොළොන්නරුවේ ඉදි කිරීමට චෝළයන් කටයුතු කළ අතර ඒ සෑම නිර්මාණයක්ම දකුණු ඉන්දීය ආභාෂය සහිත වීම විශේෂත්වයකි. මෙම වකවානුවේ දී ම එක් හින්දු දේවාලයක් දකුණු චීනයේ ක්වාන්ජෝ නගරයේ දී ක්‍රි.ව. 1281ට ආසන්න කාලයේ දී ඉදිකර ඇත[1]. යුවාන් රාජවංශ සමයේ ඉදිකරන ලද ඉහත හින්දු දේවාලය එම රාජවංශ සමයේ දී ම කඩා බිඳ දමන්නට රාජකීය නියෝගයක් ලැබී තිබේ. මෙම දේවාලයට අයත් ගෘහ නිර්මාණ අවශේෂ 1933 දී අහම්බෙන් අනාවරණය කරගන්නට සමත් විය. දැනට හින්දු දේවාලයේ ගොඩනැගිලි අවශේෂ ක්වාන්ජෝහි (Quanzhou) කයියුවාන් විහාරස්ථානයේ ද (Kaiyuan temple) මුහුදු පුරාවිද්‍යා කෞතුකාගාරයේ ද (Maritime museum) මාජු දේවස්ථානයේ ද (Mazhou temple) ටියැන්හෝ විහාරස්ථානයේ ද (Tiangho temple) ශියාමන් නගරයේ ශියාමන් විශ්වවිද්‍යාල (Xiamen University) කෞතුකාගාරයේ ද තැන්පත් කර ඇත. මෙම සියලු අවශේෂ පෙර සඳහන් කළ පරිදි ම දකුණු ඉන්දීය ආභාෂය සහිතව නිමවා තිබීම විශේෂ වේ[2]. උක්ත හින්දු දේවාලයේ කැටයම් පුවරු සම්පූර්ණයෙන්ම හින්දු දේවකතා මුල්කරගෙන නිමවන ලද ඒවාය[3].

දකුණු චීනයේ ඉදිකරන ලද හින්දු දේවාලය යුවාන් අධිරාජයා විසින් කඩා බිඳ දමන්නට කටයුතු කළ නමුත් ශ්‍රී ලංකාවේ තත්ත්වය ඊට වෙනස් මුහුණුවරක් ගනු ලැබීය. චෝළ බලය පරාජය කර රාජ්‍යත්වයට පත් විජයබාහු රජතුමා හින්දු දේවාල විනාශ කරනු වෙනුවට ඒවා තව දුරටත් ස්ථාවර කර ගැනීමට අවශ්‍ය රාජ්‍ය අනුග්‍රහයය ලබාදුන් බව සැලකිය හැකිය. එසේ හෙයින් පොළොන්නරුව මුල්කරගෙන හින්දු දේවාල රාශියක් තවදුරටත් ආරක්ෂා වී තිබේ. දකුණු ඉන්දියාවේත් ශ්‍රී ලංකාවේත් හා චීනයේත් දැනට අනාවරණය කරගෙන ඇති හින්දු දේවාලවල කලාත්මක හා වාස්තු විද්‍යාත්මක අංගයන් පහත සඳහන් අයුරින් එකිනෙකට සැසඳීමට හැකියාවක් පවතී.


**විෂ්ණු**

විෂ්ණු ප්‍රතිමාව හින්දු දේවාලවල ප්‍රධාන පූජනීය මූර්තියක් වශයෙන් තැන්පත් කර ඇත. දෑත් සතරක් සහිතව උඩුකය නිරාවරණය වන හා අනේකවිද ආභරණයන්ගෙන් සමන්විත විෂ්ණු ප්‍රතිමා ඉහත අධ්‍යයන කලාප තුනෙහිම දක්නට හැකිය. ඉදිරිපත් කරනු ලබන කලාවේ සුළු වෙනස්කම් හැරුණු විට සංකල්පමය වශයෙන් විෂ්ණු එකිනෙකට සමාන කම් කියයි. තිරුවෙල්වික්කුඩි දේවාලයේ විෂ්ණු අවම සැරසිලිවලින් ඉදිරිපත් කර ඇති අතර අර්ධ උන්නත  නිර්මාණයකි. ක්වාන්ජෝ ප්‍රතිමාව ස්වාධීන හා පූර්ණ උන්නතව නිමවා තිබෙන්නකි. ශ්‍රී ලංකාවේ වාර්තාවී ඇති උක්ත කාල සීමාවට අයත් විෂ්ණු ප්‍රතිමා සිය සියල්ලක් ම මනහර අලංකාර නිර්මාණ ලෙස ඉදිරිපත් කර ඇත.

| තිරුවෙල්වික්කුඩි | ක්වාන්ජෝ | ශ්‍රී ලංකාව | ශ්‍රී ලංකාව |
|---|---|---|---|
|  |  |  |  |

**නටරාජ**

හින්දු දේවාලවල බහුලව ම දකින්නට හැකි සංකල්පයක් වන්නේ නටරාජ හෙවත් ශිවගේ නර්තන ඉරියව්ව යි. දකුණු ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ හින්දු දේවාලවල දක්වා ඇති නටරාජ මහත් කලාත්මක, ආරෝහ පරිනාහ දේහධාරීව ඉදිරිපත් වන නමුත් ක්වාන්ජෝහි නටරාජ රුවෙහි එවැන්නක් දක්නට නැත. එය ආධුනිකයෙකුගේ නිර්මාණයක් බඳුව ඉදිරිපත් වේ. මීට ප්‍රධාන හේතුව වන්නට ඇත්තේ චීන ජනතාවට ශිව පිළිබඳව තිබුණු වූ ආකල්පය විය යුතුය. ලංකාවේ දී ඉතා උසස් තාත්වික නිර්මාණයක් ලෙස නටරාජ් ඉදිරිපත් වීමට අඩ සියවසකට වඩා පැතිරී තිබුණු චෝළ බලය මෙන්ම සංස්කෘතික සංහිඳියාව හේතුවුවා විය යුතුයි.

| තිරුවෙල්වික්කුඩි | ක්වාන්ජෝ | ශ්‍රී ලංකාව |
|---|---|---|
|  |  |  |

**මල්ලව පොර කරුවන්**

හින්දු දේවාල කැටයම් අතර මල්ලවපොර කරුවන්ගේ කැටයම් දුලබ නොවේ. තමිල්නාඩුවෙ දරසුරම් ශිව දේවාලයෙත්, ක්වාන්ජෝ දේවාලයේත් මල්ලවපොර කරුවන් කැටයම් බොහෝ සෙයින් සමානකම් කියන අතර, චෝළ පාලන කාලයෙන් පසුව එළඹෙන ගම්පොල හා මහනුවර රාජධානිවල තරමක් වෙනස් අයුරකින් මල්ලවපොර කරුවන් සහිත කැටයම් යොදා තිබේ.

| දරසුරම් ශිව දේවාලය | කයියුවාන් විහාරය | ශ්‍රී ලංකාව |
|---|---|---|
|  |  |  |

**පූජනීය ගවයා**

හින්දු සම්ප්‍රදායේ දී මහත් ගෞරවයට පත් සත්වයා වන්නේ ගවයා ය. හින්දු දේවාලවල සිව් දිසාවේ මෙන්ම ද්වාරය ඉදිරිපිට වැතිර සිටින ගවරුවක් පිහිටුවීම සාමාන්‍ය සම්ප්‍රදාය යි. දකුණු ඉන්දීය දේවාලවල ගවයා දැක්වීමේ දී ඉතාමත් පෘෂ්ඨීමත්ව හා විවිධ අලංකරණයන්ගෙන් විභූෂිතව දැක්වෙන අතර ශ්‍රී ලංකාවේ දී හා චීනයේ දී තත්වය තරමක් වෙනස් වේ. කැටයම්වල අලංකරණ තරමක් අඩු වන නමුත් ගවයාගේ ස්වභාවය සැලකිය යුතු අයුරින් රැකෙන ලෙස නිමවා තිබෙනු දැකිය හැකිය. ශ්‍රී ලංකාවේ හින්දු දේවාල ආශ්‍රිතව ගවයන් රාශියක් අනාවරණය කරගෙන සිටියත් චීනයෙන් වාර්තා වන්නේ ගව රූප දෙකක් පමණි. ඊට වඩා වැඩි සංඛ්‍යාවක් තිබෙන්නට ඇති නමුත් මේ වන තෙක් අනාවරණය කර ගෙන නැත.

| ඉන්දියාව | කයියුවාන් විහාරය | ශ්‍රී ලංකාව |
|---|---|---|
|  |   |   |

**සටය**

කුළුණුවල අවසානයේ හෝ ආරම්භයේ එසේත් නැතිනම් මධ්‍යභාගයට වන්නට සට කැටයම හින්දු දේවාල සඳහා බහුලව ම යොදා ගෙන තිබේ. මේම සට කැටයම වාසනාවේ මෙන්ම සමෘද්ධියේ සංකේතයක් බැවින් හින්දු හා බෞද්ධ සමාජවල ජනගතව තිබේ. පිවිසුම් ආශ්‍රිතව සට පිහිටා තිබෙන විට ගොඩනැගිල්ලට වටිනාකමක් හා ගාම්භීරත්වයක් නිතැතින්ම අත්පත් වේ. ශ්‍රී ලංකාවේත් දකුණු ඉන්දියාවේත් දක්නට ලැබෙන සට උසින් අඩු පැතිර ගිය අටපට්ටම් සහිත වූවකි. චීනයේ හින්දු දේවාලය සම්බන්ධයෙන් ගත් විට තරමක් වෙනස්ව යෙදී තිබේ. එහි සට පළලට වඩා උසින් වැඩි වූවකි.

| ඉන්දියාව | ක්වාන්ජෝ | ශ්‍රී ලංකාව |
|---|---|---|
|  |  |  |

**<u>ශිලා ස්තම්භ</u>**

හින්දු දේවාලවල ගර්භයෙන් පිටතට පන්නවා සකසා ඇති මණ්ඩප කොටස් සඳහා භාවිතයට ගෙන ඇති ශිලා ස්ථම්භයන් ඉහත ස්ථාන තුනෙහිම එකිනෙකට සමානකම් සහිතව ඉදිරිපත් කර ඇත. හින්දු දේවාලයට ගාම්භීරත්වයක් එක් කිරීමට සකසා ඇති මෙම ස්ථම්භ අනේකවිද කැටයම්වලින් යුක්ත වීම පොදුවේ දක්නට ලැබෙන්නකි. හින්දු දේවාලවල සකසා ඇති ස්ථම්භ පසුකාලීන ශ්‍රී ලාංකික බෞද්ධ කලාවට සැලකිය යුතු ලෙස බලපෑම් කර ඇත. ඒවා හැකි උපරිම අයුරින් පට්ටම්, බොරදම් හා කැටයම් යොදා සැකසීමට ශිල්පියා කටයුතු කර ඇත.

| තිරුවලිසිවර -ඉන්දියාව | කයියුවාන් විහාරය | ශ්‍රී ලංකාව |
|---|---|---|
|  |  |  |

**පේකඩ**

සෑම හින්දු දේවාලයක ම පාහේ ශිලා ස්ථම්භය වහලයට හෝ ඉහළ බාල්කයට සවි වීමට පෙර පේකඩයකට සවිව අලංකාරයක් සහිතව අවසන්වේ. මෙම පේකඩ සාමාන්‍යයෙන් සිව් දිසාවට ම විහිදී පහතට නැමී යන පොහොට්ටු තුනක් හෝ පිපීගිය පුෂ්පයන් සතරක් ලෙසට සකසා තිබේ. ඇතැම් විටක එකම දේවාලයක ඇති පේකඩ එකිනෙකට වෙනස්ව මල් කැටයම් සහිතව ඉදිරිපත් කර ඇත. පසුකාලීන සිංහල කලාවට මෙම පේකඩ පැමිණෙන විට මහත් සංකීර්ණ කැටයම් සහිතව සංවර්ධනය වී ඇත.

| ත්වරන්මාැවි- ඉන්දියාව | ක්වාන්ජෝ | ශ්‍රී ලංකාව |
|---|---|---|
|  |  |  |

**<u>කපෝත</u>**


හින්දු දේවාලවල වහලය අවසන් කිරීමට යොදාගත් කපෝත මනඃකල්පිත බහිරව කැටයම දකුණු ඉන්දියාවේ දී මහත් අලංකාර ලියවැල් ඇතුළු කැටයම්වලින් යුක්ත වන අතර ශ්‍රී ලංකාවේ හා චීනයේ කපෝත කැටයම් එවැනි සංකීර්ණ ස්වරූපයක් උසුලන්නේ නැත. ඔවුනට අවශ්‍යවූයේ හුදෙක් සංකල්පීමය වශයෙන් ඉදිරිපත් කිරීමට පමණි.

| ඉන්දියාව | ක්වාන්ජෝ | ශ්‍රී ලංකාව |
|---|---|---|
|  |  |  |

**හින්දු දේවාලවල ගොඩනැගිලි සැලැස්ම**

උක්ත සඳහන් කරන ලද ස්ථානයන්හි ගොඩනගන ලද හින්දු දේවාලවල භෞතික පිහිටීම ගත් විට එකිනෙකට බොහෝ සෙයින් සමානවන ගොඩනැගිලි ලක්ෂණ දැකිය හැකිය. ඉන්දියාවේ අති විශාල ගණනක් වූ හින්දු දේවාලයන් හා ශ්‍රී ලංකාවේ හින්දු දේවාල පහසුවෙන් සසඳා බැලිය හැකි වන්නේ තව දුරටත් ඉතිරි වී ඇති දෘෂ්‍ය සාධක ප්‍රමාණවත් වන බැවිනි. නමුත් චීනයේ හින්දු දේවාලය සම්පූර්ණයෙන්ම

කඩා බිඳ දමා ඇති හෙයින් දැනට ඉතිරිවී ඇති සාධක මුල් කරගෙන මනඃකල්පිතව ඇඳ ඇති සිතුවම් සැලකිල්ලට ගැනීමට සිදුව තිබේ.

| ඉන්දියාව | ක්වාන්ජෝ | ශ්‍රී ලංකාව |
|---|---|---|
|  |  |  |

## සාරාංශය

චෝළ පාලන අවධියේ දී ශ්‍රී ලංකාවේත් චීනයේත් ගොඩනගන ලද හින්දු දේවාලවල කලාව හා වාස්තුවිද්‍යාව එකිනෙකට සමාන වන්නට බලපෑ ප්‍රධාන හේතුව වන්නට ඇත්තේ දකුණු ඉන්දීය ශිල්පීන්ගේ මැදිහත් වීම විය යුතුය. මෙම හින්දු දේවාල බොහෝ විට දකුණු ඉන්දියාවේ දී කොටස් වශයෙන් සකසා අදාළ ස්ථානයට රැගෙන යන්නට ඇත. නමුත් සම්පූර්ණ නිර්මාණයම දකුණු ඉන්දියාවේ දී සිදු නොවූවා විය හැකිය. සියුම් කැටයම්, අවසන් නිර්මාණය සිදුවන ස්ථානයේ සිදු කළ බව සැලකිය හැකිය. එහි ප්‍රතිඵලයක් ලෙසට වාස්තුවිද්‍යාත්මක වශයෙන් මෙම සියලුම හින්දු දේවාල සමානකම් කියන නමුත් සියුම් කැටයම් ඵලක දැක්වීමේ දී ඒ ඒ රටට ආවේණික අයුරින් සකසා තිබේ. උදාහරණයක් ලෙස, ඇත්රජ කිඹුලාගෙන් බේරාගන්නා දෙවියන් දැක්වෙන කැටයම පෙන්වා දිය හැකිය. චීනයේ ඇති හින්දු දේවාලයේ එම කැටයම ඵලකය දැක්වීමේ දී කිඹුලාගේ හිස මකර හිසක් මෙන් දක්වා ඇත. ශ්‍රී ලංකාවේදී අංක 2 දේවාලයේ කැටයම් ඵලක තවත් උදාහරණ ලෙස ගත හැකිය. පොළොන්නරුව සමයේදී පරාක්‍රමබාහු හෝ පුලතිසි ප්‍රතිමාව ලෙස හඳුනාගන්නා මූර්තියේ ලක්ෂණ එලෙසම දැකිය හැකි කැටයමක් ඉහත දේවාලයේ දැකිය හැකිය. අනෙක් අතට බෞද්ධ විහාරස්ථානවල දක්නට ලැබෙන කොරවක් ගලට බෙහෙවින් සමාන කොරවක් ගල් හින්දු දේවාලවල ද දැකිය හැකිය. තවද, මේ වනවිට ඉදිවෙමින් පවතින මන්නාරමේ තිරිකෝණේශ්වරම් හින්දු දේවාලයට අදාළ සියලු නිර්මාණ කටයුතු සිදුකරන්නේ දකුණු ඉන්දීය ශිල්පීන්ගේ ප්‍රධානත්වයෙනි. එහි වාස්තුවිද්‍යාත්මක අංග බොහෝමයක් දකුණු ඉන්දියාවේ සකස් කර මෙරටට ගෙන්වා ඇත. ඒවා අංක පිළිවෙළට කැබැල්ලෙන් කැබැල්ල තබමින් ඉදිවන හින්දු දේවාලය සම්පූර්ණයෙන්ම දකුණු ඉන්දීය නිර්මාණයක් ලෙස දර්ශනය වේ.

මූලාශ්‍ර


1. Ranasinghe G (2013), Maritime Cultural interaction between Sri Lanka and China Based on archaeological artifacts of both countries,  Xiamen University, China, pp.174-186.

2. Lee, R. (2012) Construction community: Tamil merchant temples in India and China, 850-1281, Graduate school of art and science, Colombia University pp. 134-186.

3. Salan, AS. (2012) The ancient Hindu Heritage Site in the Qunzhou port in Chunming, W. Maritime Cultural heritage and archaeology in the Surrounding China, Science press, Beijing, pp. 247-266.